# වර්තමාන භික්ෂූන් වහන්සේලා ආගමික වත් පිළිවෙත් තුළින් දුරස්වී තිබේද යන්න පිළිබඳ විමර්ශනයක්

ආචාර්ය පනාමුරේ චන්දිම හිමි

මිහිඳු මහ රහතන් වහන්සේ විසින් අරිට්ඨ ඇමතිවරයා පැවිදි කිරීමෙන් ඇරඹුණු ශ්‍රී ලාංකීය භික්ෂු සමාජය මත ඓතිහාසික සමාජ භූමිකාව සුවිශේෂී වෙයි. ඒ අනුව ආගමික සමාජික සංස්කෘතික වශයෙන් විවිධාකාර වෙයි. ආගමික වශයෙන් භික්ෂුව ක්‍රියා කිරීම ඔහු සතුවන සුවිශේෂීම වගකීම වෙයි. භික්ෂුව යනුවෙන් හඳුන්වනු ලබන්නේ කවරෙක්ද යන්න පිළිබඳ විමසීමෙන් ඒ බව සනාථ කරගත හැකිය. එහෙත් වර්තමානයේ භික්ෂු සමාජයේ ඇති වී ඇති විවිධ වෙනස්කම් අනුව භික්ෂු ජීවිතයේ මූලික පරමාර්ථවලින් ඈත් වී ඇති බවක් පෙනෙයි. විවිධ සාමාජීය සංස්කෘති හා ආර්ථික හේතූන් මෙන්ම සංකීර්ණ සමාජ පෙරළීන් ද මෙයට හේතු වන බව දැකිය හැකිය.

වර්තමාන සමාජය පිළිබඳ විමර්ශනයේ දී භික්ෂූන් වහ්නසේලා ආගමික වත්පිළිවෙත් වලින් ඈත් වීම පිළිබඳ සිදු කරන මෙම අධ්‍යයනයේ දී භික්ෂූත්වය පිළිබඳ පළමුවෙන් ම අධ්‍යයනය කළ යුතුය. අටුවාචාරීන්ගේ විග්‍රහයට අනුව වෘජ් ධාතුන් උපන් ප්‍රවෘජ්‍යා යන පදය සරලව විස්තර කරනුයේ යහපත් වූ නොනවතින ගමනක යෙදෙන යන අර්ථයෙනි. අභිමුඛයෙහි ගමන් ඇති නිරවද්‍ය ගමනක යෙදෙන යන අර්ථයෙන් ද ප්‍රවෘජ්‍යා යන පදය විස්තර කෙරෙයි. සිංහල භාෂාවේ දී එය පැවිද්ද ලෙස ව්‍යවහාරය වෙයි. වජ යන්න ගැල යන අර්ථයෙන් ද ව්‍යවහාර වෙයි. ඒ අනුව ගැලෙන් නික්මීම පැවිද්ද යන අර්ථයෙන් විග්‍රහ කරයි.[1] "අගාරස්මා අනගාරියං පබ්බජන්ති" යන පාඨය අනුව පැවිද්ද යනු ගිහිගෙයින් නික්මීම බව බුද්ධ භාෂිතයට අනුව අවබෝධ කරගත හැකිය.

අට්ඨකථාචාරීන් වහන්සේලාගේ විග්‍රහයට අනුව භික්ඛු හෝ භික්ෂු යන පදය අවබෝධ කර ගැනීම වැදගත් වෙයි. පාලි භාෂාවේ ඒ සඳහා යෙදී ඇති නිර්වචන රාශියක් වෙයි. සංසාර භයං ඉක්ඛතීති භික්ඛු'' සසර බිය දක්නා පුද්ගලයා භික්ෂුව නම් වන බව මේ අනුව අවබෝධ කරගත හැකිය. "ඡින්න භින්න පටධරොතීති භික්ඛු'' සිඳුණු බිඳුණු සළු හෙවත් සුන් බුන් වස්ත්‍ර දරන්නේ භික්ෂුව නම් වන බව එයින් කියවෙයි. ''භික්ඛාය ජීවිතං පවිසෙන්තීති භික්ඛු'' සිඟමනෙන් ජීවිකාව පවත්වනුයේ භික්ෂුව නම් වෙයි. එසේම, ''ධාරෝ භික්ඛු, ''භද්‍රො භික්ඛු'' යන වදන් තුළින් ද ගුණයෙන් මහත් වූයේ භික්ෂුව යැයි ද, ගුණයෙන් නොබිඳෙන සුළු වූයේ භික්ෂුව යැයි ද විග්‍රහ කර ඇත. භික්ෂුවක් සතු මෙම ගුණාංග වත්මන් භික්ෂුව තුළ පවතී ද යන්න විමසිය යුතුය. නූතන භික්ෂුන් වහන්සේලා මෙම මූලික පරමාර්ථවලින් ඉවත් වී ඇත්ද යන්න විමසිය යුතුය. විශේෂයෙන් මෙහිදී භික්ෂු සමාජය යනුවෙන් හැඳින්වූවද පොදුවේ සමස්ත භික්ෂු සමාජය නොව එකී සමාජයේ සිටින ඇතැම් පිරිසක් පමණක් ආගමික වත් පිළිවෙත් වලින් දුරස් වී සිටින ආකාරයක් ඇති බව විමර්ශනය කිරීම මෙම පර්යේෂණයේ මූලික අභිමතාර්ථය වෙයි.

මුල් බුදු සමය තුළ පැවිදි වීමට හේතුවන අපේක්ෂා සතරක් මහා වග්ග පාලියේ පඤ්චම බණවර කොටසේ පාරමිකතා වග්ගයේ දී දක්වා ඇත. ඒ අනුව

''පංසුකූල චීවරං නිස්සාය පබ්බජ්ජා

පිණ්ඩියාලෝක භෝජනං නිස්සාය පබ්බජ්ජා

රුක්ඛ මූල සෙනාසනං අස්සාය පබ්බජ්ජා

පූති මුත්ත භෙසජ්ජං නිස්සාය පබ්බජ්ජා''[2]

පාංශුකූල චීවරය නිසා පිඬු සිඟා යෑමෙන් ලැබෙන භෝජනය නිසා, රුක්මුල් සේනාසන නිසා, පල් වූ ගෝමුත්‍ර ආදී ඖෂධ නිසා පැවිද්දකු යැපෙන බව නිහතමානීව පිළිගත යුතුය. සුඛෝපභෝගී සිව් පසයක් අපේක්ෂාවෙන් කුල පුත්‍රයෙක් පැවිදි භූමියට පත් නොවේ. අතිරේක ලාභ ලැබුණත් ඒ මත්තෙහි අල්පේච්ඡ මහණකම බහුභාණ්ඩික කරගත යුතු නොවන බව

පැහැදිලිය. භික්ෂූන් වහන්සේලාගේ අභ්‍යන්තර මානසික මට්ටම සකස් විය යුතු වන්නේ මුල් බුදු සමයේ එන විනය නීති හා හර පද්ධතිය ඔස්සේ බව පෙන්වා දිය හැකිය. වත්මන් භික්ෂු පරපුරේ ද වගකීම විය යුත්තේ එය වුවත් එසේ නොවීම අභාග්‍යයකි. කසාවතක් ගත දරාගත් පමණින් භික්ෂුවක් නොවන බව ද ප්‍රකාශ කළ යුතුය. වර්තමාන සමාජයේ වෙළඳ පොළට අලුතින් එකතු වූ ලාභදායි භාණ්ඩය වන්නේ චීවරය හා අට පිරිකරයි. එසේ නොමැති නම් චීවරදාරියා මුදල් පසුපස හඹා යෑම භික්ෂුවකට උචිත නොවන බව විනය පිටකයේ සඳහන් වෙයි.[3]

මුල් බුදු සමයේ භික්ෂුව ලෙස අර්ථ ගන්වා ඇත්තේ මානසික පරිවර්තනයක් සහිතව මනාව සංවර වූ ඉන්ද්‍රියන් ඇතිව සියලු ඥාතිමිත්‍ර ධනධාන්‍ය ආදිය අත්හැර අභ්‍යන්තර හා බාහිර පාරිශුද්ධත්වයෙන් යුතු පිරිසකි.[4] වල්පොල රාහුල හිමියන් විසින් රචනා කරන ලද ලක්දිව බුදු සමයේ ඉතිහාසය නම් ග්‍රන්ථයේ දී බටහිර පඬිවරයෙකු වූ 'බෙරිඩේල් කීත්' මහතාගේ භික්ෂුව පිළිබඳ වූ ප්‍රකාශනයක් උපුටා දක්වා ඇත. එහිදී, ඔහු පවසන්නේ,

''ආගමික ශාස්තෘවරයෙකු හැටියට පෙරදිග ලෝකයේ මේ තාක් බිහි වූවන් අතර අගතැන ගන්නේ බුදුන් වහන්සේය. ආදර්ශමත් ව විනය නීති හා ශික්ෂාවන් පනවා වදාළ උන්වහන්සේ උත්තරිතර අනුගාමිකයන් පිරිසක් ලොවට දායාද කළ සේක. ඥානයේ ප්‍රතිමූර්තියක් බඳු වූ ශාරිපුත්‍ර වැනි භික්ෂූන් ද භික්ෂූන්ට උසස්ම අධ්‍යාත්මික තත්වයක් ගෙනදීමට සමත් මොග්ගල්ලාන වැනි භික්ෂූන් ද විචිත්‍ර ධර්මධරයෙකු ලෙස පෙනී සිටි මහා කාශ්‍යප වැනි භික්ෂූන් ද විචිත්‍ර ධර්මකථිකයෙකු වශයෙන් ප්‍රකට වූ මන්තානිපුත්ත වැනි භික්ෂූන් ද බහුශ්‍රැතයන්ගෙන් අග්‍ර වූ ආනන්ද තෙරුන් වැනි ශ්‍රේෂ්ඨ භික්ෂූන් පිරිසක් පහළ වීම නිසා බුදු සමයට විශේෂ ආලෝකයක් ලැබීම පුදුමයක් නොවේ.[5]

බටහිර පඬිවරයෙක වූ "බෙරිඩේල් කීත්" මහතා කරන මෙම ප්‍රකාශයෙන් මැනවින් පැහැදිලි වන්නේ සමස්ත භික්ෂු සංස්ථාව ඉතාම ප්‍රගතිශීලී ඍජු භාවාදි ගුණයෙන් යුක්ත පිරිසක් වූ බවයි.

භික්ෂු සමාජය පිළිබඳව භික්ෂූන් වහන්සේලා කරන ලද ප්‍රකාශ බොහෝමයක් ථෙරගාථා පාලියේ සඳහන් වෙයි. බුදුරජාණන් වහන්සේගේ දේශනාවට අනුව අනුක්‍රමයෙන් සම්බුද්ධ සාසනය පරිහානියට පත් වෙයි. එය වැලැක්විය නොහැක්කකි.

මහා කාශ්‍යප මහරහතන් වහන්සේ වරක් බුදුන් වහන්සේගෙන් විමසා සිටින්නේ ස්වාමීනි, අතීතයේ ශික්ෂා පද තිබුණේ ඉතා ස්වල්පයකි. එහෙත් රහත්හු බොහෝ ගණනක් විසූහ. අද දවසේ ශික්ෂාපද රාශියකි. එහෙත් රහත්හු අඩුය. මෙයට හේතුව කුමක්ද? යනුවෙන් විචාළහ. එවිට බුදුරජාණන් වහන්සේ එසේය, කාශ්‍යප මිනිසුන් පිරිහෙන විට ආර්ය ධර්මය අතුරුදහන් වන විට ශික්ෂාපද වැඩි වන්නේය. රහත් බවට පත්වන භික්ෂූන් ගණන අඩුවන්නේය, යනුවෙන් දේශනා කළහ.[6]

මෙම ප්‍රකාශයෙන් ද භික්ෂු සමාජයේ ක්‍රියාකාරිත්වය හා ස්වභාවය අවබෝධ කරගත හැකිය. තවද ථෙරගාථාවන්හි පාරාපරිය තෙරුන්ගේ උදානයෙහි ඉතා වැදගත් අදහසක් අන්තර්ගත වෙයි.

බුදුරජාණන් වහන්සේ පිරිනිවන් පෑමෙන් ටික කලකට පසු පරාපරිය නම් තෙරුන් වහන්සේ නමක් සංඝයාගේ පරිහානිය හා දුර්භාග්‍ය සම්පන්න ස්වභාවය ගැන පසු තැවෙයි. බුදුරජාණන් වහන්සේ ජීවමානව වැඩ සිටි කාලයේ දී භික්ෂූන් වහන්සේලා සිල්වත් ජීවිතයක් ගත කළා. එහෙත් දැන් ඔවුන් නොහික්මුණු නොදැමුණු බවට පත්වී ඇතැයි පරාපරිය තෙරණුවෝ ප්‍රකාශ කරති. එසේම මහරහතන් වහන්සේලා දැන් මියපරලොව ගොස්ය. එබඳු ශ්‍රේෂ්ඨ උත්තමයෝ දැන් නොමැත.[7]

එසේම ථෙරගාථා පාළියේ ඵුස්ස ථෙර ගාථා කොටසේ දී ප්‍රකාශ කරනු ලබන්නේ ''අනාගතයේදී භික්ෂූන් වහන්සේලා අතිශයින් දුෂ්ට වන බවද ශාස්තෘන් වහන්සේ විසින් තහනම් කරන ලද දේවල් කරමින් සාපරාධි වන බවට ද අනාවැකික් පළකොට ඇත.[8]

මෙම ප්‍රකාශ තුළින් අනාවරණය කරගත හැකි වන්නේ භික්ෂූන් වහන්සේ අතීතයේ දී ඉතාම සිල්වත්ව වැඩ සිටි බව හා

ක්‍රම ක්‍රමයෙන් භික්ෂූන් දුස්සීලයන් බවට පත්වන ආකාරයයි. ඒ බව බුදුන් වහන්සේ ද දේශනා කොට ඇත. සමස්තයක් ලෙස මහා සමාජය සීලයෙන් ගුණයෙන් පිරිහෙන විට කුඩා සමාජයන් පිරිහීමට පත්වීම සාමාන්‍ය දෙයකි.

ලක්දිවට බුදුදහම රැගෙන ඒමෙන් අනතුරුව ඇති වූ භික්ෂු සමාජය තුළ ද එකී ලක්ෂණය දැකිය හැකිය. ලක්දිව නොයෙක් තැන්වල රහතන් වහන්සේලා වැඩ සිටි බව වංශකතා හා නොයෙක් සාක්ෂ්‍ය ඉදිරිපත් කළ හැකිය. මුල්කාලීනව විදර්ශනා ධුරයට නැඹුරුව වාසය කළ භික්ෂූන් වහන්සේලා පසුකාලීනව ග්‍රන්ථ ධූරයට ද යොමු වූ බව පෙන්වා දිය හැකිය. මජ්ඣිම නිකාය අට්ඨකථාවේ සඳහන් වන සුවිශේෂී කියමනක් මෙහිදී වැදගත් වෙයි. මෙයින් කියවෙන්නේ "එකස්මිං හි කාලේ පටිවෙධකරා භික්ඛු බහු හොන්ති. එස භික්ඛු පුථුජ්ජනොති අංගුලිපසාරෙත්වා දස්සෙතබ්බො හොති."

මෙහි අදහස වන්නේ එක් කලෙක පෘථග්ජන භික්ෂූන් කොතරම් දුර්ලභ වූයේද යත් ඇඟිල්ලෙන් පෙන්වා දෙන්නට නොහැකි තරම් දුර්ලභ වූ බව පැවසෙයි. ඒ අනුව සෝවාන් ආදී මාර්ග ඵලවලට පත් වූ භික්ෂූන් හැර අන්‍ය භික්ෂූන් නොවූ බව කියවෙයි.

අතීතයේ සිටම ලක්දිව භික්ෂුව ආගමික වත් පිළිවෙත් ගරු කරමින් ක්‍රියා කළ ආකාරය අවබෝධ කරගත හැකිය. ලක්දිව වංශ කතා මෙන්ම ඓතිහාසික තොරතුරු විමසීමෙන් එම තොරතුරු සනාථ කරගත හැකිය.

අතීත ලක්දිව වැසියා බුදු දහම කෙරෙහි මහත් වූ ගෞරවයකින් හා භක්තියකින් යුක්තව සිදු කරන ලද පුද පූජාවන් බොහෝය. එම සෑම තැනකදීම මූලිකත්වය ගෙන ක්‍රියා කරන ලද්දේ භික්ෂූන් වහන්සේය. පොදු ජන ජීවිතයේ උපතේ සිට මරණය දක්වා සෑම අවස්ථාවකදීම භික්ෂුව මූලික විය. භික්ෂුවගේ මූලිකත්වය ඇතිව සිදු කරන සුවිශේෂී ආගමික වත් පිළිවෙත් අතර

- විහාර පූජා කිරීම

- ප්‍රතිමා අභිෂේකය
- දීප පූජාව
- කඨින පිංකම
- ධාතු පූජා
- ප්‍රතිමා පූජා
- ග්‍රන්ථ පූජා
- භූමි පූජා
- දේව පූජා
- භාණ්ඩ පූජා

මෙම සෑම ආගමික උත්සවයක් සඳහා මූලික වශයෙන් භික්ෂූන් වහන්සේලා ප්‍රධාන විය. උන්වහන්සේලා සියලු තැන්හි පෙරගමන් කරුවෝ වූහ. මහාවිහාරවාසී භික්ෂූන් වහන්සේලා මෙන් ම අභයගිරික භික්ෂූන් වහන්සේලාද එදිනෙදා ආගමික වතාවත් මෙන්ම සුවිශේෂී ආගමික වතාවත් ද සිදුකර ඇති බවට වංශකතා සාක්ෂි දරයි.

ශ්‍රී ලාංකික භික්ෂු චර්යාව ථෙරවාදී සම්ප්‍රදායට අනුව ගොඩනැගුණු අතර කාලයාගේ ඇවෑමෙන් මහායානික සම්ප්‍රදායන් දෙසට නැඹුරු වූ ආකාරය දැකිය හැකිය. ඒ සඳහා විදේශීය සබඳතා, මහායාන බලපෑම් ආදිය පෙන්වාදිය හැකිය. විදස්සනාධූර භික්ෂූන් ක්‍රම ක්‍රමයෙන් ග්‍රන්ථධූර දෙසට යොමු වූ ආකාරය අවබෝධ කර ගත හැකිය.

විසිවන සියවස අගභාගය වන විට භික්ෂු චර්යාව හැල්ලුවට මෙන්ම නොවටිනා තත්ත්වයකට පත්විය. අසීමිතව රාජපාක්ෂික භාවය භික්ෂූන් වෙතින් දිස්වූයේ ඒ සමයේය. අගතිගාමීව ක්‍රියා කිරීම, රාජ්‍ය සේවයට සමීප වීම, භික්ෂු පරමාර්ථ තුළින් ඈත් වීමක් ලෙස පෙන්වා දිය හැකිය. භික්ෂු චර්යාව මෙන්ම ශාසනය පිළිබඳ අවබෝධයක් නැති පිරිස් කෙතරම් වෙහෙර විහාර ඉදිකළත් භික්ෂු සමාජය මහා පෙරලියකට පසුබෑමකට මෙන්ම පිරිස් බලයෙන් පරිහානියට පත්වෙමින් පවතී යයි පැවසීම අසත්‍යයක් නොවේ.

මෙයට වසර කිහිපයකට පෙර සසුන්ගතවීමට පෙරත් සසුන්ගත වූ පසුත් ක්‍රමානුකූල වූ ශාසනික අධ්‍යාපනයක් පන්සලෙන් ආචාර්ය උපාධ්‍යායන්ගෙන් ලැබුණි. එබැවින් ඒ මූලික හික්මීමෙන් සංවර වූ භික්ෂූන්ට උසස් අධ්‍යාපනයක් ලබා ගත්තේ වුවද ශාසනික ඇල්ම ආචාර්ය උපාධ්‍යායන් කෙරෙහි වූ ගෞරවය නොවෙනස්ව පැවතුණාහ. එකල භික්ෂුව අධ්‍යාපනය ලැබුව ද භික්ෂූත්වය ආරක්ෂා කිරීමට වෙහෙස වී ක්‍රියා කළේය. අධිරාජ්‍යවාදීන් හඳුන්වා දුන් විශ්වවිද්‍යාල අධ්‍යාපනයට භික්ෂුව යොමු වීමත් සමග ත්‍රිපිටකය ඉගෙනීමට තිබූ මූලිකත්වය අවසන් විය. විවිධ සාමාජීය විද්‍යාවන් හැදෑරීමට යොමු වී තම පෞද්ගලික අභිමතාර්ථ වෙනුවෙන් ක්‍රියා කළහ.

වර්තමාන සංකීර්ණ සමාජ තලයෙහි එබඳු රැකියාවක නියැලෙන භික්ෂුවකට කොතෙක් දුරට තම භික්ෂූත්වය ආරක්ෂා කර ගැනීම සඳහා ක්‍රියා කළ හැකිද යන්න විමසිය යුතුය. ඇතැම් විට වර්තමාන භික්ෂූන් වහන්සේලා තමන්ට නොගැලපෙන රැකියාවන් පවා සිදු කරන අතර එවැනි තැන් වලදී භික්ෂූන් වහන්සේලාට විශේෂත්වයක් හිමි නොවෙයි. තම ගෞරවය පවා ආරක්ෂා නොවන තත්වයක් තුළ ආගමික වතාවත් සිදු කිරීමට අවස්ථාවක් නොලැබෙයි.

වත්මන් භික්ෂු සමාජය පමණක් නොව සමස්ථ සිංහල බෞද්ධ සමාජයම සදාචාර සෝදාපාලුවකට ලක්වී ඇති බව නොරහසකි. මහා සමාජය සදාචාරමය වශයෙන් පරිහානියට පත්වන විට කුඩා සමාජ කණ්ඩායම් පරිහානියට ලක්වීම නොවැළැක්විය හැක්කකි. නොගැලපෙන ක්ෂේත්‍ර දෙකක දියුණුව මෙම සමස්ත පරිහානියට හේතුව බව සුප්‍රසිද්ධ බෞද්ධ උගතෙකු වන මහාචාර්ය ඔලිවර් අබේනායක මහතා පවසයි. තම බෞද්ධ අධ්‍යයන විමර්ශන නම් කෘතියේදී ඔහු මෙසේ පවසයි.

"අද්‍යතන ශ්‍රී ලාංකික බෞද්ධ සමාජයේ කැපී පෙනෙන පැතිකඩ දෙකක් ඇති බව බැලූ බැල්මට පෙනේ. ඉන් එකක් නම් බෞද්ධ කටයුතු සම්බන්ධයෙන් පවතින උද්‍යෝගයයි. අනෙක නම් සදාචාරය විෂයෙහි දක්වන කුසීත බවයි. එකිනෙකට පරස්පර විරෝධී වූ මේ ක්‍රියාදාම සමාජ බලවේග දෙකක් හැටියට

සැලකිය යුතු ප්‍රමාණයක ගැටුමක් නොමැතිව ඉදිරියට ගමන් කරනු දක්නට ලැබේ.''[9]

නොගැළපෙන අංශ දෙකක් ලෙස එතුමා පෙන්වා දී ඇති සදාචාර පක්ෂය පරිහානියට පත්වීමත් ආගමික අංශය දියුණුවීමත් පෙන්වාදිය හැකිය. වර්තමාන බෞද්ධයන් මෙන්ම භික්ෂූන් වහන්සේලා සිදුකරන මහත් වූ ආගමික වත්පිළිවෙත් හදවතට එකඟව නොව ප්‍රදර්ශනාත්මක ස්වරූපයෙන් කරන බව මේ අනුව අවබෝධ කරගත හැකිය.

භික්ෂූන් වහන්සේලා ආගමික වත්පිළිවෙත් වලින් ඉවත්වීමට හේතු කිහිපයක් මෙම පර්යේෂණයේදී අනාවරණය විය. වර්තමාන ශ්‍රී ලාංකික බෞද්ධ සංස්කෘතියෙහි අධ්‍යාත්මික ශාන්ති මාර්ග ලෙස ප්‍රකටව පවතින පිළිවෙත් කිහිපයක් ලෙස 'දානය, පාංශුකූලය, පිරිත් දේශනාව, ධර්ම දේශනාව, බෝධි පූජා සහ බුද්ධ පූජා, සීල සමාදාන, භාවනා, කප්රුක් පූජා ආදිය හැඳින්විය හැකිය. මෙම සෑම ආගමික වත්පිළිවෙතකදී ම භික්ෂූන් වහන්සේලා සක්‍රියව දායක වන අවස්ථා දැකිය හැකිය. එහෙත් බොහෝ අලස ස්වභාවයකින් ඒවාට සම්බන්ධවන ආකාරය ද දැකිය හැකිය.

වර්තමාන තරුණ භික්ෂුව කාර්ය බහුලතාවයෙන් යුක්ත නූතන තාක්ෂණික මෙවලම් භාවිතයෙන් ගෝලීයකරණයට අනුගතවීම, ගිහියන් පරිභෝග කරන ඇතැම් සම්පත් පරිහරණය, නිසා කාර්ය බහුල වී ඇත. ගැලපෙන සාජයට අනුව අනුගත වීමත් නූතන තාක්ෂණය භාවිතය නිසා භික්ෂුවගේ කාර්ය පහසු විමත් නූතන තාක්ෂණික උපකරණ භික්ෂූන් වහන්සේලාට නොගැලපේ යයි පැවසිය නොහැකිය. එහෙත් මෙම පිළිවෙත බුදුන් වහන්සේ අනුදත් ධර්මය ලෝකයා වෙත ගෙන යෑමට කොතරම් දුරට උපකාර වන්නේදැයි වත්මන් භික්ෂු සමාජය ප්‍රත්‍යාවලෝකනය කළ යුතුය.

විවිධ ඡකියාවන්හි නිරතවන භික්ෂූන් වහන්සේ කාර්යබහුල බව නිසාම ආගමික වතාවත්වලින් ඈත් වී සිටියි. ඇතැම්විට රජයේ දෙපාර්තමේන්තුවල, ආයතන ආදියෙහි සේවය කරන

භික්ෂූන් වහන්සේලා තම රැකියාව උසස් කොට ක්‍රියා කරන අතර දිනපතා උදේ සවස බුදුන් වැඳීමට පවා එම භික්ෂූන්ට අවස්ථාවක් නොමැත. ගිහි පැවිදි දෙපාර්ශ්වයම වර්තමානයේ පිළිගත් මතයක් වන්නේ ජීවිතයේ උපරිම ඵලය ලාභ සත්කාර, කීර්ති ප්‍රශංසා ලැබිය යුතුය යන්නයි. මෙම අදහස මුල් බුදු සමයට ඉදුරාම වෙනස් වූවකි. ලාභ සත්කාර ආදියේ යෙදෙන විට භික්ෂු ජීවිතය පරිහානියට පත්වන බව බුදුන් වහන්සේ දේශනා කොට ඇත.[10]

භික්ෂූන් වහන්සේලා ලාභ සත්කාර නැමති බිලී කොක්ක අතට ගත් පසුව සිරකරුවන් මෙන් ආමිසයට ගිජුවන බව පෙන්වා දි ඇත. ආමිසය පසුපස හඹායෑම තුළින් භික්ෂූත්වය පරිහානියට පත් වෙයි.

ලංකාවේ පිරිවෙන් අධ්‍යාපනය තුළ භික්ෂූන් වහන්සේලා වත්පිළිවෙත් වලින් ඈත් වී ක්‍රියා කිරීම ද ආගමික වත් පිළිවෙත් තුළින් භික්ෂූන් වහන්සේලා ඈත් වීමට හේතු වෙයි. ඇතැම් පිරිවෙන්හි බුදුන් වැඳීම, වත පිරිත් කීම වැනි ආගමික වතාවත් ද සිදු නොවෙයි. ඒවායේ ඉගෙනුම ලබන භික්ෂූන් වහන්සේලා තුළ ආගමික වත් පිළිවෙත් පිළිබඳ කැමැත්තක් ඇති නොවීම භික්ෂූන් වහන්සේලා ආගමික වතාවත් තුළින් ඈත් විමට ප්‍රධාන හේතුවක් වෙයි.

මෙම පර්යේෂණයට සම්බන්ධව ක්ෂේත්‍ර ගවේෂණයේ දී දත්ත සපයන්නෙකු වූ එක් පිරිවෙනක අධ්‍යාපනය ලබන ශිෂ්‍ය හිමිනමක් ප්‍රකාශ කළේ ''අපට බුදුන් වඳින්න වෙලාවක් නෑ හාමුදුරුවනේ. පිරිවෙන් ගිහින් එනකොට රෑ වෙනවා. ෆේස්බුක් දවසට පැය දෙකක් විතර ඉන්නවා. බුදුන් වඳින්න වෙලාවක් නෑ. අනික බුදුන් වඳින්න කියලා අපිට කව්රුවත් බල කරන්නෙත් නෑ. අපි අපිට ඕන විදියට ඉන්නවා.'' යනුවෙනි. නිසි පාලනයක් නොමැති නිසා කුඩා භික්ෂූන් වහන්සේලා ආගමික වත් පිළිවෙත් වලින් ඉවත් වී සිටින ආකාරය අවබෝධ කර ගත හැකිය. විහාරාධිපති හිමිවරු හා පරිවේණාචාර්ය හිමිවරු ද මූලික ආගමික වත් පිළිවෙත් කෙරෙහි උදාසීන ස්වභාවයක් පෙන්නුම් කිරිම ආගමික වත්පිළිවෙත් තුළින් භික්ෂුව ඉවත් විමට බලපා ඇති බව පෙන්වා දිය හැකිය.

මාගේ පර්යේෂණයේ දී දත්ත දායකයන්ගෙන් ලබාගත් තොරතුරු අනුව භික්ෂූන් වහන්සේලා ආගමික වත් පිළිවෙත්වලින් ඈත් වීමට ප්‍රධාන හේතුවක් ලෙස හඳුනා ගන්නා ලද්දේ උන්වහන්සේලාගේ අවිවේකී බවයි. එසේම බුදුන් වැඳීම වත් පිරිත් දේශනා කිරීම බෝධි පූජාවන් පැවැත් වීම වැනි දේ භික්ෂුව විසින් සිදු නොකරන නිසා ගිහි බෞද්ධයන් එවැනි ක්‍රියාවන් සිදු කිරීමේ ප්‍රවණතාවක් දැකිය හැකිය.

නවීන තාක්ෂණයේ දියුණුවත් සමග ඇති වූ විප්ලවයේ ප්‍රතිඵලයක් ලෙස කුඩා භික්ෂූන් වහන්සේලා වෙතට දුරකථනය පරිගණකය වැනි භාණ්ඩ ලැබීමත් සමග ඒවා වෙත ඇබ්බැහි වූ ස්වභාවයක් දැකිය හැකිය. ඔවුන් විවේකී සෑම අවස්ථාවක ම අන්තර්ජාලයේ සැරිසරමින් ක්‍රියා කිරීම තුළ ආගමික පිළිවෙත් වලින් භික්ෂූන් ඈත්වීම සිදුවන ආකාරය අවබෝධ කරගත හැකිය.

වසරකට වරක් හෝ දෙකක් සුවිශාල පින්කම් සිදුකරන නිසා එම පින්කම්වලට පමණක් සීමා වී ක්‍රියා කිරීම නිසා ද දිනපතා සිදුකරන ආගමික වත් පිළිවෙත්වලින් භික්ෂූන් ඉවත්වීම සිදුවෙයි. වර්තමානයේ දැකිය හැකි සුවිශේෂී ලක්ෂණයක් වන්නේ ආගමික වත් පිළිවෙත් නිරර්ථක දේ ලෙස ඔවුන්ගේ නිර්දය උපහාසයට ලක් වීමයි. මේවා දකින තරුණ භික්ෂූන් වහන්සේලා ද එවැනි දේ කිරිම තමාට නොගැළපෙන්නක් ලෙස දකියි. සමාජයේ ගොඩනග නු ලබන යම් යම් මතවාදයන් නිසා ආගමික වත් පිළිවෙත්වල යෙදෙන භික්ෂූන් වහන්සේලා ඒ කෙරෙහි අලීන බවක් දක්වන බවද පෙන්වා දිය හැකිය. නිදසුනක් ලෙස ආගමික වත් පිළිවෙතක් ලෙස බෝධි පූජාවන් පැවැත්වීම ගත් විට බෝධි පූජාව යනු කිසිඳු අර්ථයක් සිදු නොවන දෙයක් ලෙස ප්‍රසිද්ධ රූපවාහිනි සංවාදවලදී ඉදිරිපත් කරයි. එම අදහස් සමාජ ගත වීමේ ප්‍රතිඵලයක් ලෙස ද භික්ෂූන් වහන්සේලා ආගමික වත් පිළිවෙත් වලින් ඉවත් වි ක්‍රියා කරන ආකාරය දැකිය හැකිය.

ආකල්පමය වශයෙන් භික්ෂුව ශක්තිමත් නොවීමත් ආගමික වත් පිළිවෙත්වලින් භික්ෂූන් වහන්සේලා ඈත් වීමට හේතු වෙයි. මූලික අධ්‍යාපනය තුළ භික්ෂු ආකල්ප කෙරෙහි ආශාවක් හෝ කමැත්තක් ඇති නොවේ නම් එම භික්ෂුව තම ජීවිතය හෝ

ආකල්ප පුද සිරිත් වත්පිළිවෙත් කෙරෙහි හැඟීමක් ඇති කර නොගනියි.

බොහෝ ආගමික වත් පිළිවෙත් ආදායම් මාර්ග වශයෙන් යොදා ගැනීම නිසා ද භික්ෂූන් වහන්සේලා එම පිළිවෙත් වෙතින් ඉවත් වීම සිදුවෙයි. නොයෙක් පුද පූජාවන් සිදු කරන්නේ කුමක් හෝ ආර්ථික වාසියක් නිසා යැයි මතයක් සමාජයෙහි පවතින නිසා පොදු හෝ සාමූහිකව සිදු කරන ආගමික වතාවත් තුළින් භික්ෂූන් වහන්සේලා ඉවත්වීම සිදුවෙයි. අඹ තෙල් පූජා, තෙසැත්තෑඥාන පූජා, අටවිසි පූජා ආදිය මේවාට උදාහරණ වශයෙන් දැක්විය හැකිය. හුදෙක් එවැනි පිංකම් සිදු කරන්නේ ම ආර්ථිකමය ලාභ අපේක්ෂාවෙනි.


ආගමික වතාවත් සිදුකිරීම තුළින් ප්‍රතිඵල නොලැබේ යන විශ්වාසය ද ඇතැම් භික්ෂූන් වහන්සේලා තුළ පවතී. එම නිසා ඇතැම් භික්ෂූන් වහන්සේලා පොහොය දින ධර්ම දේශනා, ධර්ම සාකච්ඡා ආදී කිසිවක් සිදු නොකරයි. ''ඒවා කරල වැඩක් නෑ. කවුරු වත් හරියට අහන්නෙ නැහැ. මොනතරම් ධර්ම දේශනා කළත් ඒවා අහල නැහුණු අය වගේ ඉන්නවා. කවදාවත් තමන්ගේ වැරදි හදාගන්න උත්සාහ කරන්නෙ නැහැ. ඉතින් අපි තව බණ කිව්වත් ඔච්චර තමයි.'' මෙම ප්‍රකාශය එක්තරා සම්පත්දායක භික්ෂූන් වහන්සේ නමක් වෙතින් සිදු කරන ලද අතර ආගමික වශයෙන් භික්ෂූන් වහන්සේලා ඉවත්වීමට එය ද හේතුවක් වී ඇති ආකාරය පෙන්වාදිය හැකිය.

වැඩිහිටි භික්ෂූන් වහන්සේලා ත්‍රිපිටකයේ යම් යම් පාඨ ඉගෙන ගෙන බුදුන් වහන්සේ දේශනා කර ඇති නිසා ආගමික වතාවත්වල නොයෙදෙන භික්ෂූන් වහන්සේලා ද දැකිය හැකිය. ඔවුන්ගේ තර්කය වන්නේ බුදුරජාණන් වහන්සේ ලෞකික පුද පූජාවලට වඩා ප්‍රතිපත්ති පූජාව අගය කර ඇති බවය. ලෞකික ආගමික වතාවත් සිදු කිරීම ගිහි බෞද්ධයන්ගේ වගකීමක් බව එම භික්ෂූන් වහන්සේලාගේ අදහසයි. ඒ අනුව ගිහියන් විසින් සියල්ල සිදු කරන තුරු ආගමික වතාවත්වලින් ඉවත් වී ක්‍රියා කිරීමට එකී භික්ෂූන් වහන්සේලා උත්සාහ දරයි. සම්බුද්ධ දේශනාවන් හා සම්බන්ධව සලකා බැලීමේදී එම ප්‍රකාශයෙහි යම් සත්‍යතාවක්

පවතී. එහෙත් සමාජීය වශයෙන් හා සංස්කෘතිකමය වශයෙන් සලකා බැලීමේදී එවැනි දාර්ශනික මත තම ආධ්‍යාත්මික දියුණුව සඳහා යොදා ගනිමින් සාමාජීය අවශ්‍යතා ඉටු කළ යුතු යුගයක් වර්තමානයේ අප හමුවේ ඇති බව අවබෝධ කරගත යුතුය.

භික්ෂූන් වහන්සේලා සම්බන්ධ කරගෙන සිදු කරන ලද මෙම පර්යේෂණයේදී භික්ෂූන් වහන්සේලා ආගමික වතාවත්වලින් ඉවත්වීමට හේතු ලෙස ගවේෂණය වූ කරුණු මෙසේ ප්‍රස්තාරගත කොට දැක්විය හැකිය.

- කාර්ය බහුල නිසා ආගමික වතාවත් සිදු නොකරන
- ගුරු හිමිවරුන් නොකරන නිසා ආගමික වතාවත් සිදු නොකරන
- ආමිස පූජාවන් අර්ථශූන්‍ය ලෙස සලකා ඒවා නොකර සිටිම




ඉහත දක්වන ලද ආකාරයට ශ්‍රී ලාංකික පොදු ජනයාගේ ජනප්‍රිය බෞද්ධ සංස්කෘතික ලක්ෂණ හෙවත් ආගමික වතාවත්වලින් භික්ෂූන් වහන්සේලා ඈත්වීමට හේතු ගවේෂණය විය.

එසේම අපගේ පර්යේෂණයෙන් අනාවරණය කරගන්නා ලද තොරතුරු වලින් භික්ෂූන් වහන්සේලා ආගමික පිළිවෙත් කෙරෙහි යොමු කිරීම සඳහා සුදුසු යැයි හඳුනා ගන්නා ලද

යෝජනා මාලාවක් මෙසේ ඉදිරිපත් කළ හැකිය.

- මූලික අධ්‍යාපනය ලබන භික්ෂූන් වහන්සේලා වෙත ආගමික වතාවත් පිළිබඳ හැඟීමක් ඇති කරවීමට වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- ආගමික වැඩසටහන්වල අගය හා ඒවා සිදුකිරීම තුළ සංස්කෘතික ලක්ෂණ ආරක්ෂා වන බව අවබෝධ කරවීම.
- භික්ෂු කතිකාවත් හෝ භික්ෂු විනය හා භික්ෂුවකගේ කාර්යභාරය පිළිබඳ භික්ෂු සමාජය තුළ සංවාදයක් ගොඩනැගීම.
- භික්ෂු සමාජයේ පිරිස පවත්වාගෙන යෑමට වගකිවයුතු භික්ෂූන් වහන්සේලා යොමුකරවීම.
- මූලික පිරිවෙන් තුළට ප්‍රායෝගික බෞද්ධ අධ්‍යයනය පිළිබඳ විෂයයන් ඇතුළත් කිරීම.

ඉහතින් සඳහන් කරන ලද කරුණුවලින් මනාව අවබෝධ කරගත හැකි වන්නේ වත්මන් භික්ෂූන් වහන්සේලා විවිධ හේතූන් මත ආගමික වත් පිළිවෙත් තුළින් ඈත් වී ඇති ආකාරය හා එම ව්‍යසනයෙන් භික්ෂු සංස්ථාව මුදවා ගැනීමට ගතහැකි යෝජනාවන් පිළිබඳවයි. එසේම මෙහිදී පැහැදිලි කළ යුතු වන්නේ යම් කිසි භික්ෂුවක් වත් පිළිවෙත් සම්පූර්ණ නොකරන්නේ නම් ඔහුගේ සීලය සම්පූර්ණ නොවන බවයි.

පරමාදර්ශී භික්ෂු සමාජයක් ගොඩනැගීමට හා භික්ෂුව වෙතින් ගිලිහී ගොස් තිබෙන සමාජනායකත්වය ගොඩනැගීමට ඉහත යෝජනා ඉවහල්වනු ඇති බව අපේක්ෂා කළ හැකිය.

**ආන්තික සටහන්**

1. පියතිස්ස හිමි, කුඹල්වල, *දයාබර පොඩි නම වෙතටයි*, ගොඩගේ ප්‍රකාශන, 22 පිටුව, 2011.
2. *මහාවග්ගපාළිය*, පඤ්චම බණවර, පණාමිකතා, ත්‍රි.බු.ජ.මු.
3. *සුත්තනිපාතය*, මෙත්ත සූත්‍රය, 44 පිටුව, ත්‍රි.බු.ජ.මු. 2006, කොළඹ.
4. *පාචිත්තියපාළි*, නිස්සග්ගිය බණ්ඩ රූපිය සික්ඛාපද, 580 පිටුව, ත්‍රි.බු.ජ.මු.

5. මේධානන්ද හිමි, දේවාලේගම, *බෞද්ධ භික්ෂු සමාජය*, 58 පිටුව.
6. වල්පොල රාහුල හිමි, *ලක්දිව බුදු සමයේ ඉතිහාසය*, 204 පිටුව, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ 10.
7. *සංයුත්තනිකාය, 1*, 279 පිටුව, ත්‍රි.බු.ජ.මු.
8. *ථෙරගාථා*, 302 පිටුව, පාරාපරියත්ථෙර ගාථා, ත්‍රි.බු.ජ.මු.
9. *එම*, ඵුස්සථෙර ගාථා, 305 පිටුව, ත්‍රි.බු.ජමු.
10. *මජ්ඣිමනිකාය අට්ඨකථා*, 881 පිටුව.
11. ඔලිවර් අබේනායක, *බෞද්ධ අධ්‍යයන විමර්ශන*, සංස්කාරකවරු මහමිතව පඤ්ඤාරතන හිමි, පහලගම ධම්මික හිමි, විජේසූරිය ග්‍රන්ථ කේන්ද්‍රය, 247 පිටුව.